# ස්ත්‍රිය හා දුගීභාවය:ශ්‍රී ලංකා සමාජය ඇසුරින් කෙරෙන විග්‍රහයක්

කුමුදු සුමේධා සංජීවනී

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භය මාතෘ මූලිකවූවක් යැයි හඟිනත් වත්මන් සමාජය වූ කලී පුරුෂ මූලික වග පැවසීම අවිනිශ්චිතාර්ථ දක්වන්නක් නොවේ. එමතු නොව මනුෂ්‍ය ජීවිතයේ සෑම ඉසව්වකටම අවශෝෂණය වී ඇති ධනවාදය වර්තමානය වන විට ලෝකයේ වැඩිමනක් ජනයා දරිද්‍රතාවයෙන් පෙළෙන කාරණය බවට පත්ව ඇත.

මෙම ලිපියේ අරමුණවන්නේ උක්ත ද්වි ප්‍රපංචයන් එක්වන නැත්හි ආන්තිකරණයට ලක්වන ස්ත්‍රිය පිළිබඳ විමසුමක් සිදුකිරීමයි. මෙහි දී සමාජීය ගොඩනැගීමක් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳවත්, වෙසෙසින් ආර්ථික ක්ෂේත්‍රයෙහි ඇයගේ දායකත්වය පිළිබඳවත් විමර්ශනය කිරීමයි. ගෙවුණු දශක කිහිපයක ස්ත්‍රී සේවා නියුක්තියේ ප්‍රවණතාවත් හා ඇය කෙරෙහි යොමුව ඇති ආකල්පයත් ඇසුරු කරගනිමින් මෙම ලිපිය ස්ත්‍රී සේවා නියුක්තිය සම්බන්ධයෙන් පළවූ ශාස්ත්‍රීය ලිපි ලේඛන ද පරිශීලනය කර ඇත.

## ආර්ථික ලිබරල්කරණය ස්ත්‍රී විමුක්තියේ නිර්ණාය

පුද්ගලයෙකු දරිද්‍රතාවයට පත්වීම කෙරෙහි අඩු ආදායම් පමණක් නොව විවිධ සමාජ, දේශපාලන, සංස්කෘතික සාධක ද බලපානු ලබයි. දුගීබව තුරන්කිරීම සඳහා ගගන චුම්බන යෝජනා, ප්‍රතිපත්ති හුදෙක් අඩු ආදායම් තත්ත්වයන් පමණක් සැලකිල්ලට ගනිනම් සැබවින් ම දුගීභාවයට පත් ව ඇති, වරප්‍රසාද අහිමි පුද්ගල කණ්ඩායම් මඟහැරෙනු ඇත. බොහෝදුරට දූප්පතුන් අතර බැහැර කර කථාකරන කණ්ඩායමක් ලෙස ස්ත්‍රිය හඳුනාගත හැකිය.

පුරුෂ මූලික චින්තන රටාවන්, සමාජ වරප්‍රසාද බෙදීයාමේ අසමානතාව වැනි හේතු සාධක තුළ ස්ත්‍රිය යනු විවිධ සමාජ අසාධාරණයන්ට ලක්වන කොටසකි. ඉහළ අධ්‍යාපන වරප්‍රසාද ඔස්සේ උසස් රැකියා අවස්ථා හා ඉහළ සමාජ වරප්‍රසාදයන් ඉතාමත් සුළුතරයක් වූ ස්ත්‍රීන් හිමිකරගෙන ඇතත් තවමත් ලාංකීය සමාජය තුළ දුගීබවින් පීඩනයට පත්වන ග්‍රාමීය නාගරික ස්ත්‍රීන් බහුල ය.

දකුණු ආසියාතික කලාපය දරිද්‍රතාවයෙන් දැඩිලෙස පීඩාවට පත්වන කලාපයකි. මෙහි සංවේදීතාවය ඉතාමත් සෘජුවම බලපා ඇත්තේ ස්ත්‍රියට ය. ලාංකීය සමාජ සන්දර්භයේ සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්වීම් හේතුකොටගෙන ස්ත්‍රියට අධ්‍යාපන වරප්‍රසාද හිමිවීම, සර්වජන ඡන්දබලය හිමිවීම, 70 දශකයෙන් පසු ඇති වූ ආර්ථිකමය වෙනස්වීම් සමඟ ම ආර්ථික, දේශපාලන හා සමාජීය අවකාශයන්හි ස්ත්‍රිය යම් මට්ටමකට ඉඩප්‍රස්ථාවන් ලඟාකරගත්ත ද වර්තමානය වනවිට නිසි ඇගයීමකට ඇය පාත්‍ර වී නොමැත.